# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.04.22 පැය 2340 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/810 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>

### 01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කළුතර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශය.

2025.04.22 වන අද දින දහවල් කාලයේ කළුතර දකුණ පොලිස් වසමේ කොහොලාන ප්‍රදේශයේදී කළුතර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 126 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන කළුතර දකුණ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 23 ක් වන කොහොලාන, දකුණු කළුතර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කළුතර දකුණ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - තලංගම පොලිස් ස්ථානය.

2025.04.22 වන අද දින දහවල් කාලයේ තලංගම පොලිස් වසමේ කළල්ගොඩ වීර මාවත අසලදී තලංගම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 30 ක් වන හෝකන්දර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තලංගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 03. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.

2025.04.21 වන දින රාත්‍රී කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ ස්ටේස් පාර ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 15 මිලිග්‍රෑම් 210 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 58 ක් වන කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 04. සැක කටයුතු මරණයක් - මුන්දලම පොලිස් ස්ථානය.

2025.04.22 වන අද දින උදෑසන කාලයේ මුන්දලම පොලිස් වසමේ බරලන්කට්ටුව ප්‍රදේශයේ **ගරාජයක් තුළ පුද්ගලයෙකු සැක කටයුතු ලෙස**

**මියගොස්** සිටින බවට මුන්දලම පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් අනුව විමර්ශනක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 39 ක් වූ බරලන්කට්ටුව, මුන්දලම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු කථන ආබාධිත පුද්ගලයෙකි. මොහු තවත් මිතුරෙකු සමඟ ප්‍රදේශයේ පැවැති සංගීත සන්දශර්යක් නැරඹීමට පිටව ගොස් මත්පැන් පානය කර නැවත මිතුරාගේ නිවසට පැමිණ ගරාජයේ නිදා සිට ඇති බවට දැනට සිදුකරන ලද විමශර්නවලදී අනාවරණය වී ඇත.

පශ්චාත් මරණ පරීක්ෂණ 2025.04.23 වන දින සිදුකිරීමට නියමිත අතර මෘත ශරීරය පුත්තලම රෝහලේ මෘත ශරිරාගාරයේ තැන්පත් කර ඇත. මුන්දලම පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 05. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - වැලිකන්ද පොලිස් ස්ථානය

2025.04.22 වන අද දින දහවල් කාලයේ වැලිකන්ද පොලිස් වසමේ පැරකුම්යාය ප්‍රදේශයේදී වැලිකන්ද පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 36 ක් වන පැරකුම්යාය, මහවැලි සිංහපුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වැලිකන්ද පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**